14 වන පිටෙන්

හැඳින්වේ. ඉන්දියාවේ ජය ශ්‍රී මහා බෝධියේ අංකුරයක් ලෙස අනුරාධපුරයේ රෝපණය කර තිබෙන, ශ්‍රී මහා බෝධියට වසර 2250 කට වැඩි ඉතිහාසයක් තිබේ. ශ්‍රී මහා බෝධිය ලොව වාර්තා ගත, පැරණිම රෝපණය කරන ලද ශාකය ලෙසද, ඉතිහාස ගත වී ඇත. ඝර්ම කලාපීය වනාන්තර වල බහුල, Ficus benghalensis යන නමින් හැඳින්වෙන නුග ශාකද බෞද්ධ ඉතිහාසයේ බොහෝ සිද්ධි හා සම්බන්ධව පවතී.

බෞද්ධ සාහිත්‍යනයට අනුව කෝනාගම බුදුන්ට සෙවන දුන් බෝධි වෘක්ෂය අත්තික්කා ලෙස හැඳින්වේ. එසේම හින්දු බැතිමතුන්ගේ භක්තියට ලක්වී ඇති අත්තික්කා වෘක්ෂය ගණදෙවි වාස භවන ලෙස සලකා මහත් පුද සත්කාර පවත්වනු ලබයි.

2. මැද පෙරදිග නිජ භුමිය වන Ficus carica ෆිග් ශාකයද, ක්‍රිස්තු ආගමේ සමහර සිද්ධි හා බද්ධව පවතින බව පෙනේ. හීබෲ බයිබලයේ සඳහන් වන තුන්වන ශාකය ෆිග් ශාකයයි. එසේ සඳහන් වන පළමු සහ දෙවන ශාක, ජීවන ශාකය සහ ප්‍රඥා ශාකය වන අතර තුන්වැන්න සඳහා දක්වා ඇත්තේ ෆිග් ශාකයයි. මෙයට අදාළ බයිබල් පාඨය මෙසේය

The fig tree is the third tree to be mentioned by name in the Hebrew Bible' The first is the Tree of life and the second is the Tree of the knowledge of good and evil' Adam and Eve used the leaves of the fig tree to sew garments for them-selves after the Fall" when they realized that they were naked (Genesis 3-7)

ආදම් සහ ඒව දැක්වෙන චිත්‍ර සටහන් වල, නග්න බව වැසීම සඳහා ෆිග් ශාක පත්‍රය යොදා ගනු ලබන්නේ මෙම බයිබල් වැකිය ආශ්‍රිතව විය හැකිය.

3. මුස්ලිම් බැතිමතුන්ගේ, ශුද්ධ කුරානයේද ( Quran, 95:1) වාක්‍යයෙන් ෆිග් ඵලයෙන් ලැබෙන මහත් ඵල ප්‍රයෝජන සහ එහි වැදගත් කම ගැන විග්‍රහයක් කර තිබෙන්නේ මෙසේය (Quran, 95:1)

[I swear] by the fig and the olive'

**මම ෆිග් සහ ඔලිව් නාමයෙන් (දිවුරමි)**

( The reference to the Fig fruit in the first verse of Surat at-Tin, is a wisest one in terms of the bene-fits imparted by this fruit )

මෙම කරුණු ගැන සිතා බලනවිට, Ficus ගණයට අයත් ශාක, මිනිසාගේ ආරම්භ යුගවල සිටම, මිනිසාට මහත් ඵල ප්‍රයෝජන ලබාදී ඇති බවට බොහෝ සාක්ෂි සොයා ගත හැකිය. අපගේ ඇසට, දුරක සිටම පෙනෙන පුෂ්ප නොදැරුවත්, මෙම ශාකවල ප්‍රාග්උදුම්බරය තුළ, කුඩා අන්වීක්ෂීය පුෂ්ප, දහස් ගණනක් ඇත. මාංශල ප්‍රාග්උදුම්බරය තුළ සැඟවී තිබෙන ඉතා කුඩා පූමංගි පුෂ්ප මගින් ජායංගි පුෂ්ප පරාගණය කිරීම සඳහා, සමනලයින්, මීමැස්සන් වැනි කෘමින්ට ඇතුලට රිංගා යාමට නොහැකිය. ඒ වෙනුවට එම කාර්යය සඳහා ප්‍රාග්උදුම්බරය අග්‍රයේ ඇති, ඉතා කුඩා විවරය හරහා යාමට හැකියාව තිබෙන කෝඳුරුවන් වැනි කුඩා කෘමිහු අනුවර්තනය වී සිටිති.

ස්වභාව ධර්මයේ අපූර්ව සිදු වීමක් වන මෙය, ශාක සහ සත්ත්ව විශේෂ අතර සහසම්බන්ධතාව සිදුවන ආකාරයට සිදුවී ඇති පරිණාමයේ, හොඳම උදාහරණයක් ලෙසද සැලකිය හැකිය.

**(බයිබලයේ සහ කුරානයේ පාඨ අන්තර්ජාලයෙනි.)**

وَالتِّينِ وَالزَّيْتُونِ - التين: 1
, (Quran, 95:1)

**[I swear] by the fig and the olive.**

මම ෆිග් සහ ඔලිව් නාමයෙන් (දිවුරමි)

( The reference to the Fig fruit in the first verse of **Surat at-Tin**, is a wisest one in terms of the benefits imparted by this fruit )




